# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,196—1960 සැප්තැම්බර් 9 වැනි සිකුරාද—1960.9.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඛ කරන ලදි)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 183 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 183 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 184 |


## පළාත් පාලන නිවේදන

### 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952 කේ අංක 6 දරණ ප්‍රදෙශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරලේ හෙළ පල්ල පලාත ගම්ප්‍රදෙශයේ ගම් කායී සභාව විසින් සම්මතකරනලද පහත දක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ :—

**යෝජනාව**

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 ක්වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 17, 19 සිට 26 සහ 28 සිට 37 දක්වාවූ සියළුම කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට රත්නපුර දිස්ත්‍රික්කයේ මැද කෝරලේ හෙළ පල්ල පලාත ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනාකරනු ලැබේ.

ඩී. පී. වෙල්ලාල,
මැද කෝරළේ හෙළ පල්ල පලාත ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාවේ ප්‍රධාන තැන.

වර්ෂ 1960 ක්වූ ජූලි මස 1 වැනි දින,
ඕපනායක-හුණුවල ගම්කාර්ය සභා කාර්යාලයේදීය.

## අතුරු ව්‍යවස්ථා

ඇල්.ජී.ඩී.—ජී.ඒ 11/14/12.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ පළාත ගම් ප්‍රදේශයේ ගම්කායී සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කායාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹදීය.

**දැන්වීම් පුවරු පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1\. කායී සභාව විසින් කිසියම් දැන්වීම් පුවරුවක් ඉදිකර තිබෙන කල්හි, සභාපති තුමා විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය පිට මිස නැත්නම්, කිසිවකු විසින් කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා එකී දැන්වීම් පුවරුව පාවිච්චි නොකළ යුතු වන්නේ ය.

2\. (1) 1වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, දැන්වීම ප්‍රදර්ශනය කිරීම ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනයට යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් සභාපතිතුමා වෙත ඉදිරිපත් කර සිටිය යුතු වන්නේ ය.

එසෙත්, කිසියම් විශේෂ කාරණයක් සම්බන්ධයෙන් වූ විශේෂ කරුණු උඩ මෙම ඡේදයේ කලින් දක්වූ විධිවිධානවල සඳහන් කාල සීමාව ඇතුළත ඉදිරිපත් නොකරනු ලබන කිසියම් දැන්වීමක් වුව භාරගැනීමට සභාපති තුමාට හැකි වන්නේ ය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් සෑම ඉල්ලුම් පත්‍රයක් ම, දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට ඉල්ලුම්කරුවා බලාපොරොත්තු වන දැන්වීමේ පිටපතක් ද සමග, ඉදිරිපත් කර සිටිය යුතු වන්නේ ය.

3. (1) දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා කිසියම් දැන්වීම් පුවරුවක් පාවිච්චි කිරීම පිළිබඳව සභාපති තුමා විසින් ඉල්ලුම් පත්‍රයක් අනුමත කරනු ලබන කල්හි, එකී දැන්වීම් පුවරුව පාවිච්චි කිරීම සඳහා එක් එක් අවුරුද්ද සම්බන්ධයෙන් එකී දැන්වීම් පුවරුවේ ඕනෑම පැත්තක වර්ග ප්‍රමාණයෙන් එක් එක් හතරැස් අඩියක් සඳහා රු. 2.50 බැගින් ගණන් බලන ලද ගාස්තුවක් ගෙවන ලෙස ඉල්ලුම් කරුවාට නියම කළ යුතු වන්නේ ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ නියම කරන ගාස්තුව ගෙවනු ලබනතුරු කිසියම් දැන්වීම් පුවරුවක් පාවිච්චි කිරීම සඳහා සභාපති තුමා විසින් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු වන්නේ ය.

4. (1) (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ කිසිවෙකුට බලපත්‍රයක් නිකුත් කරනු ලබන කල්හි සභාපති තුමා විසින්—

(අ) එකී බලපත්‍රයේ සඳහන් දිනය හා අංකය දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමේ සඳහන් කරන ලෙස, හෝ,

(ආ) එකී බලපත්‍රය සඳහා ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් එකී දැන්වීමේ මුද්‍රා තබනු ලැබීම පිණිස එය සභාපති තුමා වෙත ඉදිරිපත් කර සිටින ලෙස, හෝ,

එකී තැනැත්තාට නියම කළ යුතු වන්නේ ය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ නියමයක් කරනු ලැබූ සෑම කෙනෙකු විසින් ම එකී නියමය එසේ ම පිළිපැදිය යුතු වන්නේ ය.

5. මේ අතුරු ව්‍යවස්ථාවල, පද සංසන්දනය වෙනත් කිසියම් අන්දමකට නියම කරනු ලබන්නේ නම් මිස නැත්නම්:—

"දැන්වීම්" යනුවෙන් දැන්වීමක විදියේ හෝ ඒ සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් පාවිච්චි කරනු ලබන හෝ ඕනෑම වචනයක්, අකුරක්, අංකයක්, සළකුණක්, පත්‍රිකාවක්, ලෑල්ලක්, දැන්වීමක්, ක්‍රමයක්, ආදර්ශයක්, හෝ චිත්‍රයක් හෝ නිරූපණයක් ඇතුළත් කරනු ලැබේ.

"සභාපතිතුමා" යනුවෙන්, කාර්ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩ පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

"දැන්වීම් පුවරුව" යනුවෙන්, කිසියම් සැකිල්ලක්, ආධාරයක්, කණුවක්, ලෑල්ලක්, තාප්පයක් හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා කාර්ය සභාව විසින් ඉදිකර තිබෙන වෙනත් කිසියම් සැළසුමක් අදහස් කරනු ලැබේ.

---

ඇල්.ජී.ඩී.—ජීසී14/12.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බෝයගනේ ගම්ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරනලද එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 වේ අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දීය.

### කසළ ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1957තේ මාර්තු මස 8 වැනි දින අංක 11,087 දරන ගැසට් පත්‍රයේ පළවූ යෝජනාවෙන් බෝයගනේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද කසළ ශෝධනය හා අශුචි ඉවත් කිරීම සම්බන්ධයෙන් වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල VI වැනි කාණ්ඩයේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණ සඳහා කායශී සභාව වෙත ගෙවිය යුතු මාසික කසළ ශෝධන ගාස්තුව ශත පනහක් වන්නේ ය.

ඇල්.ජී.ඩී—ජීසී.14/20

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමන්ගල්ල ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසැට් පත්‍රයේ පළවූ ප්‍රකාශයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමැතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශ කායශීංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අගෝස්තු 30 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා
#### අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය

1. කායශී සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසල ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල vi වැනි කාණ්ඩයේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණය සඳහා කායශී සභාව වෙත ගෙවිය යුතු මාසික අශුචි ඉවත් කිරීමේ ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල් එක බැගින් වන්නේ ය.

2. කායශී සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසල ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල VI වැනි කාණ්ඩයේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කායශී සභාව වෙත ගෙවිය යුතු මාසික කසල ශෝධන ගාස්තුව ශත තිස් පහ බැගින් විය යුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල "කායශී සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමන්ගල්ල ගම්ප්‍රදේශයේ ගම්කායශී සභාව අදහස් කරනු ලැබේ.

---

# විවිධ දැන්වීම්

## උඩුබද්දාව ගම්කාර්ය සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත
### (201 වෙනි පරිච්ඡේදය)

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිනීම සඳහා 1960 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව උඩුබද්දාව ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුනු සඳහා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරන ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

කේ. ආරියවංශ ඇස්. පෙරේරා,
සභාපති.

උඩුබද්දාව ගම්සභා කාර්යාලය,
1960 අගෝස්තු 30 වෙනි දින දීය.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇල්. ඒ. හිවුබට් | වැලිපැන්නගහමුල | හරක් මස්, ඌරු මස් සහ එළු මස්. |
| 2. ඇම්. ඒ. විල්බට් පෙරේරා | දුනකදෙනිය | ඌරු මස්. |